# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2024 මැයි මස 22 වන දින

## II වන කොටස

## අතිරේකය

(2024.05.29 දින නිකුත් කරන ලදී)

# ආරක්ෂණ පියවර (සංශෝධන)

**2018 අංක 3 දරන ආරක්ෂණ පියවර පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2018 අංක 3 දරන ආරක්ෂණ පියවර පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි මේ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ වන "වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ" බලතල, කාර්ය සහ කර්තව්‍ය, "ජාත්‍යන්තර වෙළෙඳාම විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා" විසින් ක්‍රියාත්මක කරනු ලැබීම, කරනු ලැබීම සහ ඉටු කරනු ලැබීම පිණිස විධිවිධාන සැලසීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලබන අතර, මේ සංශෝධනය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

එල්.ඩී.-ඕ. 46/2024

## 2018 අංක 3 දරන ආරක්ෂණ පියවර පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2024 අංක      දරන ආරක්ෂණ පියවර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2018 අංක 3 දරන ආරක්ෂණ පියවර පනතේ 2 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "(මෙහි මින් මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචන වෙනුවට "(මෙහි මින් මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාත්‍යන්තර වෙළෙඳාම විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

2018 අංක 3 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි, දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචන යෙදෙන කවර හෝ තැනක දී, ඒ වචන වෙනුවට "ජාත්‍යන්තර වෙළෙඳාම විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා" යන වචන ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" සම්බන්ධයෙන් කරනු ලබන සඳහන "ජාත්‍යන්තර වෙළෙඳාම විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා" සම්බන්ධයෙන් කරනු ලබන සඳහනක් විය යුතු බව

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව